**වර්ෂ 2025 ක් වූ ජූලි මස 29 වන දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**

**<u>මතුගම ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව</u>**

**සහභාගිත්වය -:ගරු සභිකවරු**

01. කසුන් මුණසිංහ මහතා - ගරු සභාපති
02. අනගිපුර සමන්ත රෝහණ මහතා - ගරු උප සභාපති
03. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
09. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩබ්.කේ. සුනෙත් ප්‍රියංකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. රසික දුලන්ත වික්‍රමනායක මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. විතානගේ දොන් නිශාන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. බී.ඒ. අමිල ගයාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. පී.ඩී. අමන් ප්‍රසාද් වික්‍රමසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. එම්. ජගත් විමලසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ලියනගුරුගේ ලාල් රංජිත් සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. ඒ. සුජිත් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. ගංවාරි සනත් සංජීව මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
23. මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. කළුගල හේවාගේ ගාමිණී මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. තොටගමගේ නිහාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
27. ටී. විජිතා දර්ශනී කුමාරි ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
28. කේ.ඒ.ඩී. තිළිණි මධුෂානි සිරිවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
29. කේ.කේ. කාවින්ද්‍යා ඉඳුවරනි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
30. චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
31. ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
32. ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
33. දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**නිලධාරින්**

01 නෙලු නිශාන්ති ඉද්දගොඩ මහත්මිය - ලේකම්
02 ඩබ්.ඩබ්.ජී.එල්. ප්‍රනාන්දු මහත්මිය - කළමනාකරණ සේවා නිලධාරි (සභා)

ආගම සිහිකිරිම

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තාව සම්මත කිරිම

- 2023.03.14 දින මහ සභා වාර්තාව හා 2025.07.18 දිනැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිමට ඉදිරිපත් කරමි.

2023.03.14 දින මහ සභා වාර් තාව හා 2025.07.18 වන දින විශේෂ මහ සභා රැස්වීම් වාර් තා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන

- සභික අදහස් දැක්විම

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මා වෙත සභාපතිවරයා ලෙස තේරි පත්විමට අවස්ථාව ලබාදුන් උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට මාගේ ස්තූතිය පුද කර සිටිනවා. ඒ වගේම මෙම සභාව ඉදිරියට කරගෙන යාම සඳහා ඔබතුමන්ලා සියළු දෙනාගේ ශක්තිය ධෛර්යය මේ අවස්ථාවේදී මා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඔබ සියලු දෙනාගේ අදහස් මා බලාපොරොත්තු වෙනවා. මතුගම වෙනුවෙන් වැඩ කරන්න කොට්ඨාස වෙනුවෙන් වැඩ කරන්න සියලුම දෙනාට මා ආරාධනා කරන සිටිනවා මේ අවස්ථාවේදී.

ලස්සන මතුගමක් වැඩසටහන 2025.07.25 වන දින ආරම්භ කළ අතර මේ වන විට එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු නිලධාරින්, RDA ආයතනයේ නිලධාරින් හා සේවකයින්, PRD ආයතනයේ නිලධාරින් සහ සේවකයින්, MOH ආයතනයේ නිලධාරින් හා සේවකයින් සහ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රිවරුන්ටත් සහාය දැක්විම සම්බන්ධව ස්තූතිය පුද කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා**

කොටගෙදර, කොළහැකට, හේන්පිට, ගල්මත්ත ප්‍රදේශයේ ජනතාව විසින් මා වෙත ඡන්දය ලබා දී මා පත්කර එවිමට දැක්වූ සහයෝගයට ස්තූතිය ප්‍රකාශ කිරිමට මම මෙය අවස්ථාව කර ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

1997 වර්ෂයේ සිට මේ සභාව නියෝජනය කරන කෙනෙකු හැටියට මේ සභාව නියෝජනය කිරිමට ලැබිම ගැන මා සතුටු වෙනවා. ඒ වගේම මා වෙත ඡන්දය ලබා දී මා පත්කරන ලද ජනතාවට ස්තූතිවන්ත වෙනවා. තවද, ප්‍රාදේශීය සභා සභික ලෙස අප හඳුන්වනා ඇති බැවින් එය ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලෙස නිවැරදි කරන ලෙස මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඉදිරි සභා වාරයේ සිට සභික වෙනුවට මන්ත්‍රි ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාට හා මා පත්කර එවන ලද සියලුම ජනතාවට මේ අවස්තාවේ දී ස්තූතිය පුදකර සිටිනවා. ජාතික ලැයිස්තුව නියෝජනය කළ මා කෙරෙහි විශ්වාසය තියලා වත්මන් සභාපතිතුමා මේ මන්ත්‍රීධූරය මා වෙත ලබා දිම පිළිබඳව විශේෂ ස්තූතියක් සභාපතිතුමාටත් එම කණ්ඩායමට පුද කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා**

පාන්තිය කොට්ඨාසයෙන් ඉදිරිපත් වූ මා කෙරෙහි විශ්වාසය නැවත වරක් තියලා මා වෙත ඡන්දය ලබා දුන් සියළුම ජනතාවට මාගේ ස්තූතිය පුද කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය එරංග කරවිට මහතා**

මා මන්ත්‍රිවරයෙකු ලෙස පත්කර එවීම වෙනුවෙන් වලගෙදර කොට්ඨාසයේ ප්‍රගතිශීලි යුතුකම් දන්න ජනතාවටත්, මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදරණීය දේශප්‍රේමී ජනතාව වෙත මා ස්තූතිවන්ත වෙනවා. 2018.04.26 පත්වෙලා එනවිට හිටුපු මන්ත්‍රීවරුන්ටත් උපදෙස්, අනුශාසනා, අවවාද එක්ව අපි ප්‍රාදේශීය සභාවට එක් වෙලා යම් සේවාවන් කළා. ඒ පිළිබඳව හිටපු මන්ත්‍රිවරුන්ටත් ස්තූති වන්ත වෙනවා. ඉදිරි අවු. 4 ½ ක කාලයේදී ශක්තිමත්ව සභාව සුන්දර සභාවක් ලෙස පත්කිරිමට ඔබතුමාට ශක්තිය ධෛර් යය ලැබේවායි ප්‍රාර්ථනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

මාගේ කොට්ඨාසයේ ආදරණීය ජනතාව දෙවන වරටත් මා කෙරෙහි විශ්වාසය තියලා මා පත්කර එවීම පිළිබඳව සතුටු වෙනවා. ඒ වෙනුවෙන් ඔවුන් වෙත මා ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට සුබ පතන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

මා දෙවන වරටත් මතුගම ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරියක් ලෙස කිරුළු පැළදිමට බෝපිටිය බටහිර හා නැගෙනහිර, තඹරුටිය, වැලිමානාන ආදරණීය ජනතාවටත්, මතුගම ආසනය නියෝජනය කරමින් දේශපාලන නායකත්වයක් නොමැතිව ස්වාධින කණ්ඩායමක් තුලින් මතුගම ප්‍රාදේශීය සභාවේ බලය පිහිටුවිමට අප තීරණාත්මක සාධකය බවට පත් කරමින් අපට මන්ත්‍රීධුර 04ක් ලබාදිමට කටයුතු කළ මතුගම ආසනයේ සියළුම ජනතාවට හදපිරි ප්‍රණාමය හා කෘතවේදිත්වය මේ අවස්තාවේ දී පිරිනමනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

අම්මා, තාත්තා, පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් පින්නගොඩ විතාන මහතාටත්, හොරවල ගම්මානයේ ජනතාව විසින් මා වෙත තිබු විශ්වාසය මා ජයග්‍රහණය කිරිමට උදව් කළ සියළු දෙනාටම ස්තූති කිරිමට අවස්ථාවක් කර ගන්නවා. මේ අවස්ථාවේ ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් හා ලේකම්තුමිය ඇතුළු නිලධාරින්ගෙන්ද ඉල්ලිමක් කරනවා අපි නවක මන්ත්‍රීවරුන් විදිහට අඩුපාඩු තියෙන්න පුළුවන් ඒ අඩුපාඩු පෙන්වා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම මා හට ඡන්දය ලබාදුන්

සියළුම ජනතාවට සමගි බලවේගයේ මතුගම ආසනයේ ඡන්දය ලබා දී ජාතික ලැයිස්තුවෙන් අවස්ථාව ලබා දුන් මතුගම බල ප්‍රදේශයේ ජනතාවට ස්තූතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

ප්‍රථම වතාවට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරිපත්වීම පිලිබඳව මා සතුටට පත්වෙනවා. ඒ වගේම මා වෙත ඡන්දය ලබාදුන් සියලුම ජනතාව වෙත කෘතගුණ සැලකිමක් ලෙස ඔවුන්ට ස්තූතිය ප්‍රකාශ කිරිමට අවස්තාව කර ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. ලාල් රංජිත් සිල්වා මහතා**

මම ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා මට දේශපාලනය උගන්වපු මෙරිල් මුණසිංහ මහතාට එතුමා සමඟ මෙම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීධුරයක් හිමිවිම ගැන සතුටට පත්වෙනවා. මා මේ අවස්ථාවේ මාගේ කොට්ඨාසයේ ජනතාවට ගෞරවණිය ස්තූතිය පුදකරනවා මා කෙරෙහි දැක් වූ විශ්වාසයට. මා වෙත ප්‍රාදේශීය සභාවෙන් ලැබෙන වැටුපත් මා ලබා ගන්නේ නැහැ. එම වැටුපත් ලාල් රංජිත් පදනම මගින් සමාජ සේවයට ලබා දිමට කටයුතු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාවතගේ ගාමිණි සිසිර කුලරත්න මහතා**

වැලිපැන්න බහු ආසනයේ ජනතාවට මා මුලින්ම ස්තූතිවන්න වෙමින් මතුගම ආයතනයේ සංවිධායකවරයා වන ජගත් පින්නගොඩ විතාන මහතාට ස්තූතිය ප්‍රකාශ කර සිටිමි. පක්ෂ බේදයකින් තොර මතුගම ජනතාවට සේවය ලබාදිමටත් මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරමින් මෙම සභාව හොඳ මතුගම නගරයක් කරමු යැයි මෙන්ම මතුගම සංවර්ධනය කරමු යැයි ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතා**

අළුත්ගම්ගොඩ, නවුත්තුඩුව, කීරන්තිඩිය ප්‍රදේශයේ ජනතාවට මාගේ හදපිරි සුභාසිංශනය ප්‍රකාශ කරසිටිමට කැමතියි. මතුගම ප්‍රාදේශීය සභාවේ අභිනවයෙන් පත්වන සභාපති කසුන් මුණසිංහ මහතාටද මාගේ හදපිරි සුභාශිංශනය ප්‍රකාශ කර සිටිමි.

ජාතික ජන බලවේලයේ මන්ත්‍රීවරුන් ඇතළු සියලුම මන්ත්‍රීවරුන්ට මාගේ හඳපිරි සුභාසිංශනය ප්‍රකාශ කර සිටින්නට කැමතියි. මේ සියලූ දෙනාටම මේ ‘‘පෝසත රටක් ලස්සන ජිවිතයක්‘‘ උරුම කරගන්න ලැබෙයි කියලා මා විශ්වාස කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පි.ඩී. අමන් ප්‍රසාද් මහතා**

මා වෙත ඡන්දය ලබාදුන් ජනතාවට ප්‍රථමයෙන්ම මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. ගරු සභාපති කසුන් මුණසිංහ මැතිතුමාට සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර් ථනා කරනවා. මතුගම ප්‍රාදේශීය සභාවේ හොඳ වැඩක් කරන විට අපගේ සහයෝගය ලබා දිමට බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා**

ඕවිටිගල කොට්ඨාසයේ මා ඡන්දයෙන් ඉදිරිපත් වෙනවා එහි ජයග්‍රහනය කිරිම පිළිබඳව මා සතුටටපත් වෙනවා. මෙම ප්‍රාදේශීය සභාවට තේරිපත් වූ සභාපතිතුමාගේ සිට සියලුම

මන්ත්‍රීවරුන්ට මාගේ සුභාශිංශනය මේ අවස්ථාවේ පුදකර සිටිනවා. මතුගම ප්‍රාදේශීය සභාවට දිගු ගමනක් තියෙනවා යන්න. සියළු දෙනාම එකතු වෙලා බලාපොරොත්තු වන ලස්සන මතුගමක් බිහි කිරිමට පුළුවන් වෙයි. ඒ වෙනුවෙන් සියළු දෙනාටම සුබ ප්‍රාර්ථනා එකතු කිරිමට මා කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හොරවලගේ දොන් නිශාන්ත මහතා**

මතුගම බටහිර කොට්ඨාසයේ ආදරණීය ජනතාවට මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. මේ ප්‍රදේශය සඳහා යහපත් සංවර්ධන යෝජනා සඳහා සහයෝගය දක්වන්න මම බැදිලා ඉන්නවා මේ අවස්ථාවේ දී අභිනවයෙන් පත් වූ සභාපති කසුන් මුණසිංහ මහතාට හා උප සභාපතිතුමාටද සුභාශිංශනය දැක්විමට අවස්ථාව කර ගන්නවා. පත් වූ සියළුම මන්ත්‍රී තුමන්ලා මන්ත්‍රීතුමියන්ලාට ඉදිරි වැට කටයුතු කරගැනිමට ශක්තිය ධෛර්යය ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා**

මා වෙත ඡන්දය ලබාදුන් ආදරණීය ජනතාවට ස්තූතිවන්ත වෙනවා. ඔවුන්ගේ අවශ්‍යතා අනුව කටයුතු කිරිමට පක්ෂ පාට බේදයකින් තොරව කටයුතු කරන මෙන් ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ. සුනෙත් ප්‍රියංකර මහතා**

යටදොලවත්ත නැගෙනහිර හා බටහිර කොට්ඨාසයේ මා ජයග්‍රහණය කිරිම වෙනුවෙන් ඡන්දය ලබාදුන් සියළුම ජනතාවට මාගේ හදපිරි ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. මතුගම ප්‍රාදේශීය සභාවේ අභිනවයෙන් පත් වූ සභාපතිතුමාට හා උප සභාපතිතුමාට සුභාසිංශනය ලබා දිමට මම මෙය අවස්ථාව කර ගන්නවා. ‘‘ලස්සන මතුගමක් හා පොහොසත් රටක් ලස්සන ජීවිතයක්‘‘ තේමා කරගෙන කරන කටයුතු වලට සහයෝගය ලබා දිමට බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

අභිනවයෙන් සභාපතිවරයා ලෙස ඔබතුමා පත්විම ගැන අපි සතුටු වෙනවා. ඔබතුමාට අවංකවම සුබ පතනවා ඇතුලත්මුදලිගම ජනතාවට හා වැත්තැව ප්‍රදේශයේ ජනතාවට ස්තූතිය ප්‍රකාශ කිරිමට අවස්ථාව කර ගන්නවා අපි හැමෝම බලාපොරොත්තු වෙන්නේ මතුගම මහජනතාවට සේවය කිරිමටයි. මීට පෙරත් අපි අපගේ දේශපාලන න්‍යාය පත්‍රය ඇතුලේ සහයෝගය ලබා දී තිබෙනවා. ඔබතුමා හරි දේ කරන තාක් ඔබතුමා අවංක වැඩකරන තාක් කල් මාලිමාවේ අපි කකුලෙන් අදින්න සූදානමක් නැහැ. අපිටත් ඕන මේ මතුගම හදන්නයි. අපගේ නොමසුරු සහයෝගය නිතයානුකූල හරි වැඩ වලදී ජාතික ජන බලවේගයේ මාලිමාවේ කණ්ඩායම වෙනවෙන් ඔබතුමාට ලැබේවායි මා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

අනුර ප්‍රේමලාල් සහෝදරයා ස්ව කැමැත්තෙන් ඉවත් වී තමයි මට මේ අවස්තාව ලබාදුන්නේ එතුමා ඇතුළු පුස්සලමුල්ලේ ප්‍රගතිශිලි ජනතාවට මා මේ අවස්ථාවේ දී ස්තූතිවන්ත වෙනවා මා

සමඟ තරඟවැදුනු අනෙක් අපේක්ෂිකාවන් දෙදෙනා ලැයිස්තු අපේක්ෂිකාවන් ලෙස මේ සභාවේ අසුන් ගෙන සිටිනවා එය මට සතුටට කරුණක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත කුමාර මහතා**

මතුගම ප්‍රාදේශීය සභාවේ අභිනවයෙන් තේරි පත් වූ කසුන් මුණසිංහ මහතාට මාගේ සුභාසිංශනය පුදකරන්නට ඒ වගේම උප සභාපති, ලේකම්තුමිය ඇතුළු සියළුම මන්ත්‍රීවරුන් වෙත මාගේ සුභාසිංශනය පුද කර සිටිනවා. බොන්දුපිටිය කොට්ඨාසයේ සියළුම ප්‍රගතිශීලි ආදරණීය ජනතාව වෙත මාගේ ගෞරවය පුද කර සිටිනවා. මාව මන්ත්‍රිවරයෙක් ලෙස හා මහජන සේවකයෙක් ලෙස තෝරා පත් කිරිම වෙනුවෙන් මාගේ කණ්ඩායම් නායක තුමා සංජීව රණසිංහ මහතාටත් දේශපාලන නායක නලින් ජයතිස්ස මැතිතුමාගේ හා සංවිධායක සහෝදරවරු සිහිපත් කරන්න ඕන. මේ මතුගම ලස්සන කරන්න ඔබතුමාට අයගේ සහයෝගය ලබාදෙනවා මෙන්ම නොබියව විරුද්ධ විමට බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා**

මා කෙරෙහි විශ්වාසය තබා මෙම ස්ථානයට තෝරාපත්කර එවූ ජනතාවට මාගේ ස්තූතිය ප්‍රකාශකර සිටිනවා. ඒ වගේම ඔවුන්ගේ බලාපොරොත්තු ඉෂ්ඨ කිරිම සඳහා ඔබතුමාගේ සහයෝගය මා අපේක්ෂා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා**

වලගෙදර ආදරණීය ජනතාව මාව තෝරා පත්කර එවිම සම්බන්ධව මාගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශකර සිටිනවා. ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා ඔබතුමාට අපගේ සහයෝගය ලබා දෙනවා. යම් හෙයකින් මෙයට පටහැනිව කාර්යයක් සිදු වුවහොත් කණ්ඩායමක් වශයෙන් එයට විරුද්ධ විමට ද බලාපොරොත්තු වෙනවා. හැම හොඳ කාර්යයකටම අපි සහයෝගය ලබා දෙනවා මතුගම ප්‍රාදේශිය සභාව හොඳම සභාව බවට පත් කිරිමට ඔබතුමාට ශක්තිය ලැබෙයි කියා මම සිතනවා. නවක මන්ත්‍රීවරුන්ට මෙන්ම ජොෂ්ඨ මන්ත්‍රවරුන්ටත් සුබ ප්‍රාර්ථනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

ලෙව්වන්දුව ජනතාව වැඩි ඡන්ද ලබා දෙමින් මා තෝරා පත්කිරිම වෙනුවෙන් මා ස්තූතිවන්ත වෙනවා. මේ අවස්තාවේ දී සභාපතිතුමා හා උපසභාපතුමා ඇතුව සියලුම දෙනාට සුබ පැතිමට අවස්ථාවක් කර ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා**

සභාපතිතුමනි ඔබතුමන්ගේ ජයග්‍රහණය සඳහා අපගේ සුබ පැතුම් එක්කර සිටිනවා මම හිතනවා අපි සියළු දෙනා එකතු වෙලාමේ මතුගම ප්‍රාදේශීය සභව සුවිශේෂි සන්ධිස්ථානයකට ගෙන යන්න පුළුවන් වෙයි කියලා මා මේ ප්‍රාදේශීය සභාව පත්කර එවූ ආදරණීය ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා. සභාපතිතුමනි ඔබතුමා ලබගත් ජයග්‍රහනය සංවර්ධන ජයග්‍රහනයක් කර ගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

පෙරටුගාමී සමාජවාදී පක්ෂය ලෙස දේශපාලන කටයුතු වල නියැලෙනවා මතුගම ප්‍රදේශයේ ජනතාව යම් නියෝජනයක් අපට දිලා මේ මතුගම ප්‍රාදේශීය සභාව මම නියෝජනය කරනවා අන්න ඒ නියෝජනය ලබා දුන් මතුගම ප්‍රදේශයේ ජනතාවට මම ස්තූතිවන්ත වෙනවා. ලස්සන මතුගමක් යන සභාපතිතුමාගේ සංකල්පයට අපි එකඟයි. වර්ථමාන ආණ්ඩුවේ පරිසරය සම්බන්ධ කටයුතු සඳහා සහයෝගය ඉල්ලා සිටිනවා. අනාගත පරපුර වෙනුවෙන් දායාදකර දිම සඳහා අපිත් එක්ක එකතු වෙන්න සහයෝගය දක්වන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. දුමිදු චතුර සම්පත් මහතා**

සභාපතිතුමනි මම මුලින්ම අප පක්ෂයේ නායකතුමන්ගේ හා දිස්ත්‍රික් නායක තුමාගේ සුබ පැතුම් එක් කර සිටිනවා. ගරු සභාපතිතුමනි මම ඔබට සුබ පතනවා මතුගම ප්‍රාදේශීය සභාව ලංකාවේ දක්ෂතම පළමුවන ස්ථානයට ගෙනත් දක්ෂතම ප්‍රාදේශීය සභාව බවට පත්කරන්න කියලා. මේ අවස්තාවේ මගේ දේශපාලනයේ පියා වන මහින්ද සමරසිංහ මහතාව සිහිපත් කරන්න ඕන. ලස්සන මතුගමක් හදන්න මේ මතගම ප්‍රාදේශීය සභාව ලංකාවේ හොඳම ප්‍රාදේශීය සභාව කරන්න එක්සත් ජාතික පක්ෂයේ තනි අලියට කරන්න පුළුවන් උපරිම සහයෝගය ඔබතුමා ඔය පුටුවේ ඉන්න තාක් කල් ඔබතුමාට මේ අලියාගෙන් ලැබෙන බව ප්‍රකාශ කරමින් සියළු මන්ත්‍රීවරුන්ට මා සුබ පතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය**

මේ අවස්ථාවේ සමගි ජන බලවේගය වෙනුවෙන් ඡන්දය ලබා දුන් මගේ ආදරණීය ජනතාවට මා ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා. මතුගම ආසන සංවිධායක වන ජගත් පින්නගොඩ විතාන මහතාට ස්තූතිවන්ත වෙනවා. මා නවක මන්ත්‍රීවරියක් බැවින් ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ උපදෙස් අනුශාසනා බලාපොරොත්තු වෙනවා පක්ෂ පාට බේදයකින් තොරව ''ලස්සන මතුගමක්'' යන සංකල්පයට අනුව කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය**

යටදොලවත්ත ආසනයේ ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ වෙනුවෙන් මා වෙත ඡන්දය ලබාදුන් මගේ ආදරණීය ජනතාව වෙනුවෙන් ස්තූතිය පුද කිරිමට මෙ අවස්ථාව කර ගන්නවා. අපගේ කණ්ඩායම් නායක පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතාටත් මේ අවස්තාවේ ගෞරවණීය ස්තූතිය පුද කර සිටිනවා. ලස්සන මතුගම හැදිමටත් මාගේ සහයෝගය ලබාදිමට බලාපොරොත්තු වෙනවා. සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාත් මේ ශක්තිය හා ධෛර්යය ලැබේවායා මා ප්‍රාර් ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී. විජිතා දර්ශනි කුමාරි ද සිල්වා මහත්මිය**

මතුගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රිවරියක් ලෙස පත් කිරිමට කීරන්තිඩිය කොට්ඨාසයේ පුස්සලමුල්ල ජනතාව පක්ෂ බේදයකින් තොර ස්තූතිය පුද කර සිටිමට අවස්ථාව කර ගන්නවා. මා මන්ත්‍රිවරියක් ලෙස තෝරාපත් කර ගන්නා ලද වත්මන් සභාපතිතුමාට මාගේ ස්තූතිය පුදකර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.කේ. කාවින්දා ඉඳුවරනි මහත්මිය**

මා වෙත ඡන්දය ලබාදුන් සියලුම දෙනාට ස්තූතිය පුද කිරිමට මෙ අවස්ථාවක් කර ගන්නාවා. ගරු සභාපතිතුමාට හා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ලබා ගනිමින් කටයුතු කරන්න මම කැප වී සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ.ඩී. තිළිණි මධූෂානි සිරිවර්ධන මහත්මිය**

මා වෙත ප්‍රථම වරට තේරිපත්විම වෙනුවෙන් ජගත් පින්නගොඩ විතාන මැතිතුමාට හා රසික පින්නගොඩවිතාන මැතිතුමාට ගෞරවණිය ස්තූතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. යටදොලවත්ත නැගෙනහිර හා බටහිර යන කොට්ඨාස දෙකෙහි ජනතාව මා වෙත ලබා දුන් සහයෝගයට මා ස්තූතිය පුදකර සිටිනවා. සියළු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබාගෙන මාගේ යටදොලවත්ත කොට්ඨාසයෙත් මතුගම නගරයත් සංවර්ධනය කිරිමට මාගේ ශක්තිය හා ධෛර්යය ලබා දිමට බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්.ඒ. ඔෂදි ධනංජනා මහත්මිය**

මා මේ ස්තානයට ගෙන ඒමට මාගේ කොට්ඨාසයේ ජනතාව විශාල උත්සහයක් ගත්වා ඒ අවස්ථාව වෙනුවෙන් ඔවුන්ට ස්තූතිය පුද කිරිමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා මේ අවස්ථාවේ දී ජගත් පින්නගොඩ මැතිතුමාටත් මාගේ ස්තූතිය පුදකර සිටිනවා. ලස්සන මතුගම බිහි කිරිම තමයි ඔබ අප සියලු දෙනාගේ බලාපොරොත්තුව. ඉතිං මේ ලස්සන මතුගම බිහි කිරිමේ දී සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලය එකා මෙන් සහයෝගයෙන් කටයුතු කරමු යැයි ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මා මුලින්ම ස්තූතිවන්ත වෙනවා මා වෙත සුභාසිංශන එක් කළ සියළු ම මන්ත්‍රීවරුන්ට. ජනතාවට වගකියන මන්ත්‍රීවරයෙන් වන්න තමයි හැමෝටම තියෙන අදහස, මගේ අදහස ද එයයි ජනතාවට වගකියන සභාපතිවරයෙකු විමයි. අවුරුදු 4ක කාල සිමාව තුළ කළහැකි උපරිමයෙන් මගේ මේ සභාපතිධූරයේ ඇති යුතුකම් හා වගකිම් ඉටු කිරිමට මම කටයුතු කරනවා. එම වගකිම් ඉදිරියට කරගෙන යාමට ඔබ සියළු දෙනාගේ සහයෝගය මා අපේක්ෂා කරනවා. මා හැම විටම කියන්නේ මේ සභාපතිධූරය අයිති මට නෙමෙයි මගේ ආදරණිය ජනතාවටයි. කිසි විටක වැරදි යෝජනා ගෙන ඒමට මගේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. ජනතාව වෙනුවෙන් කළයුතු යුතුකම වගකිම වෙනුවෙන් ඒ ගන්නා තින්දු තීරණ තමයි හැම වෙලාවේම ගන්නේ මොකද ඒක මගේ වගකිමක්. ඉදිරියේදී මා ඉදිරිපත් කරන කිසිම යෝජනාවකට කිසිම මන්ත්‍රිවරයෙකුට විරුද්ධ විමට අවශ්‍ය වන එකක් නැහැ කියලා මම හිතනවා. ජනතාවට වගකියන සභාපතිවරයෙකු හැටියට ඉදිරියට වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙමි.

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

(ඈ) සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

(ඊ) 01. ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා

1.1 මතුගම, පාන්තිය ලිපිනයේ පදිංචි එම්.ඒ.ටී. සමන්තිකා මහත්මිය විසින් ප්‍රාදේශීය සභා පෙර පාසල නිවුන් දරුවන් තිදෙනෙකු ඇතුලත් කිරිමේ ගාස්තුවෙන් එක් දරුවකුගේ මුදල් (රු. 3000.00) අයකර අනෙක් දරුවන් දෙදෙනාගෙන් අයකරන මුදල වන රු. 6000.00ක් වන මෙම ප්‍රමාණය නිදහස් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා**

ඇයව මම පෞද්ගලිකව හඳුනනවා ඇය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේවය කරන රාජ්‍ය නිලධාරිනියක් ඇයට නිවුන් දරුවන් තුන්දෙනෙකු ඉන්න අතර ඇයගේ මහලු මව හා පියා සමඟ තමයි ජිවත් වෙන්නේ. ඔවුන් ඉතා අමාරුවෙන් තමයි ජිවත් වෙන්නේ.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

උප සභාපතිතුමා දක්වන ආකාරයට මෙම අය රාජ්‍ය නිලධාරිනියක් කියනවා නම් අපි සභාවට ලැබෙන මුදල් නැතිකර ගැනිමක් අපි මේ කරන්නේ ඇගේ පවුලේ විස්තර සොයා බැලිය යුතුයි. ඇයට මේ අවස්ථාව දියයුතු තත්ත්වයේ සිටින කෙනෙකු නම් තුන්දෙනාම නිදහස් කරන්න වුවද මාලිමාවේ කණ්ඩායම එකගයි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

වයෝවෘද දෙමාපියන් සමඟ මේ දරුවන් තුන්දෙනෙකු සමඟ මෙම තැනැත්තිය ජිවත් වෙනවා. එක් දරුවකුට අයකර අනෙක් දරවන් දෙදෙනා නිදහස් කරන ලෙස තමයි ඉල්ලා සිටින්නේ මගෙත් පුද්ගලික මතය මේකයි මෙය කාලෝචිත යෝජනාවක් කියලා තමයි මම හිතන්නේ මා වෙත ඉදිරිපත් කළ ලිපියක් නිසයි මම අදහස් දැක්වුයේ.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි තුඩුගලගේ දොන් රෝහිත මහතා**

මේ පිළිබඳව මමත් සොයා බැලුවා මගේ කොට්ඨාසයේ නිසා. මේ කියන තත්ත්වයේ තියෙනවා නම් අපගේ විරුද්ධත්වයක් නැහැ. සභාපතිතුමා හොයලා බලලා සභාවට ඉදිරිපත් කරන්න ඉදිරියට කරන්නේ කොහොමද කියලා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි රසික දූලන්ත වික්‍රමනායක මහතා**

සමිතවංශ හිමි විසින් මෙහි සත්‍ය තේරුම් කළා. මෙහි මුද්‍රණ දෝෂ තියෙන්න බැහැ දිගින් දිගටම ඒවා නිවැරදි වෙන්න ඕන.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි මෙරිල් මුණසිංහ මහතා**

මේ දරුවන් මතුගම ප්‍රාදේශිය සභා පෙර පාසලට වෙන්න ඕන දාන්න හදන්නේ මේ නිසා අම්මා ලිපිනය දෙන්න ඇති මතුගම ලිපිනයක්. ඇතුලත්විමේ ගාස්තු පමණයි අයකන්නේ මාසික ගාස්තු අය කරන්නේ නැහැ. මේ සම්බන්ධව අපගේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා කළුගල හේවාගේ ගාමිණී මහතා**

ඇයගේ පෞද්ගලික තොරතුරු පිළිබඳව ඇය සමඟ සාකච්ඡා කර මේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස මම අදහස් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. ලාල් රංජිත් සිල්වා මහතා**

මේ තුන් නිවුන් දරුවන් බිහි කිරිම පිළිබඳව පෞද්ගලිකවම මා ගෞරවය පුද කර සිටිනවා. මෙම ප්‍රශ්නයේ දී සභාව විසින් සාධාරණයක් ඉටු නොවන්නේ නම් එම මුදල මවිසින් පරිත්‍යාග කිරිමට කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාවට ස්තුතියි. මෙය මුද්‍රණ දෝශයක් නෙමෙයි මෙය සභාව ඇතුලේ සමාජගත කරන්න එපා. මෙය මුද්‍රණ දෝෂයක් නෙමෙයි මේ අම්මා මතුගම පාසලට ඇතුලත් කරන්න මේ ලිපිනය තමයි පාසල වෙනුවෙන් ලබා දී තිබෙන්නේ පාසලට ඇතුලත් කිරිම සඳහා මෙම ලිපිනය භාවිතා කරනවා වෙන්න පුළුවන් මෙහි කිසිම මුද්‍රණ දෝෂයක් නැති බව ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

නිවැරදි නිශ්චිත සොයා බැලිමක් සිදුකර මේ තුන්දෙනාම නිදහස් කළත් අපගේ විරුද්ධත්වයක් නැහැ

**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

1.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2025 අනුව රු. 2,000,000.00 ට වඩා වැඩි ව්‍යාපෘති පිරිණැමීම ප්‍රසම්පාදනය කිරීම මගින් සිදු කළ යුතුය. යුතුය.ඒ අනුව රු. 2,000,000.00 ට අඩු ව්‍යාපෘති ප්‍රසම්පාදන කිරීම හෝ ස්වේච්ඡා සංවිධාන වෙත පිරිණැමීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**1.3** පළාත් සංවර්ධන ප්‍රදාන 2025 යටතේ අංක U258152449001 දරණ මතුගම සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවතේ කාණු ඉදිකිරිම ව්‍යාපෘතිය සඳහා අනුමත රු. 2,500,000.00ක මුදල සහ අයවැය යෝජනා 2025 සභා අරමුදල් යටතේ යෝජිත රු. 2,000,000.00ක මුදල යොදවා මාර්ගය සංවර්ධනය කිරිමට සහ එම රු. 4,500,000.00වන මුළු මුදල සඳහා සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් මිල ගණන් කැඳවා ඉටු කිරිමට සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ ලක්ෂ 45 ක මුදල පළාත් ප්‍රදාන මගින් ලක්ෂ 25ක්ද ප්‍රාදේශිය සභා අරමුදල් වලින් ලක්ෂ 20ක් ලෙස තමයි කන්නන්ගර මාවතේ කාණු පද්ධතිය ඉදිකිරිමට අපේක්ෂා කරන මුදල මේ සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් සකස් කර තිබෙනවාද එය කොතන සිට කොතන දක්වා දුර ප්‍රමාණයක්ද යන්නත්, මාගේ අදහස නම් මුල් අදියරේ ලක්ෂ 25ක ප්‍රමාණයේ කාණු පද්ධතිය කර සිටියා නම් හොඳ යැයි මගේ අදහසයි. එවිට ගොවිජන කාර්යාලය, පොලිසිය, ඉංජිනේරු කාර් යාලය, කලාප කාර් යාලය ඒ ටික කරලා ඇස්තමේන්තුව බලලා ඉදිරියට යන් කියන එක මගේ අදහස.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්. ජගත් විමලසිරි මහතා**

මමත් මේ සම්බන්ධව දිගින් දිගටම අත්දැකිම් ලබන කෙනෙක් විදිහට කඩිනමින් මේ කාණු පද්ධතිය සකස් කර වතුර බැස්සවීම ඒ වගේම අගලවත්ත පාරේ සිට සකස් කිරිමතමයි අවශ්‍යතාවය.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

අදහස් දැක්විම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**1.4** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ අංක 1846/19 හා 2014.01.21 දින අති විශේෂ IV (ආ) වැනි කොටස පළාත් සභා, පළාත් සභා නිවේදන බස්නාහිර පළාත් සභවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නිවේදනය අනුව ප්‍රාදේශිය සභාවේ සභාපති, උප සභාපති හෝ සභිකවරයෙකුට සභාවේ කාරණයක් සඳහා ගමන් කිරිමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරිමක් වශයෙන් රු. 2500.00ක ස්ථිර ගමන් වියදම් දිමනාවක් ප්‍රාදේශිය සභා අරමුදලින් ගෙවිමට සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**1.5** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ අංක 1749/23 හා 2012.03.15 දින අති විශේෂ IV (අ) වැනි කොටස පළාත් සභා, පළාත් සභා නිවේදන බස්නාහිර පළාත් සභවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නිවේදනය අනුව ප්‍රාදේශිය සභාවේ එක් සභිකයෙකු වෙනුවෙන් රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන බිල්පත් පියවිම සඳහා ප්‍රාදේශිය සභා අරමුදලින් දැරිය හැකි උපරිමය මාසිකව රුපියයල් දෙදහස් පන්සියකට (රු. 2500.00) යටත්ව දුරකථන දිමනාව ප්‍රාදේශිය සභා අරමුදලින් ගෙවීමට සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සභාපතිතුමනි පොඩි පැහැදිලි කිරිමක් කර ගන්න අවශ්‍යයයි. රු. 2500.00ම හිමිද නැතිනම් තමන්ගේ නමට බිලක් ඉදිරිපත් කළයුතුද දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

තමන්ගේ නමට බිල්පතක් ඉදිරිපත් කළයුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**

මම මේ අවස්ථාවේ මම යෝජනා කරනවා දුරකථන දිමනා අවශ්‍ය නැහැ කියලා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා**

මමත් යෝජනා කරනවා දුරකථන දිමනාව අවශ්‍ය නැහැ කියලා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.එස්.ආර්. දුමිදු චතුර සම්පත් මහතා**

තමන්ගේ කැමැත්ත අනුව එම දිමනාව ලබා ගැනිම හෝ ලබා නොගැනිම තීරණය කරන්න කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මෙරිල් මුණසිංහ මහතා**

මේක ඒකත්ඡන්දයෙන් සම්මත කර ගන්න. මෙය මන්ත්‍රීවරුන්ට අවශ්‍ය දෙයක්,

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

කැමති අයට ගන්න කියලත් අනවශ්‍ය අයට නොගෙන ඉන්න කියලා මම ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කැමති අය බිල්පත් ඉදිරිපත් කර එය ලබා ගැනිම යටතේ මෙම යෝජනාව සම්මත කර ගනිමු.

**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**1.6** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ අංක 1749/23 හා 2012.03.15 දින අති විශේෂ IV (අ) වැනි කොටස පළාත් සභා, පළාත් සභා නිවේදන බස්නාහිර පළාත් සභවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නිවේදනය අනුව ප්‍රාදේශීය සභාවේ සභාපති වෙනුවෙන් රු. 25000.00 ක දිමනාවක්ද, උප සභාපතිවරයා වෙනුවෙන් රු. 20000.00ක දිමනාවක්ද, එක් සභිකයෙකු වෙනුවෙන් රු. 15000.00ක දිමනාවක් ලෙස මාසික දිමනා පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප) ප්‍රතිපූර්ණය කිරිමට යටත්ව ගෙවිමට සභාවට යෝජනා කරමි .

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරිම - නැත

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරිම

- 2025 ජුනි මස ආදායම් වියදම් වාර්තා අමුණා ඇත.

(ඒ) න්‍යාප පත්‍රයට ඇතුලත් විය යුතු කරුණු

- සභික අදහස් දැක්විම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා**

නවුත්තුඩුව, බටකැටිය මුල්ල මාතෘ හා ළදරු සායන මධ්‍යස්ථානය හා ආයුර්වේද මධ්‍යස්ථානය ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරිම වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව,

මේ සම්බන්ධව තාක්ෂණික වාර්තාවක් ලබාගෙන කඩිනමින් සිදුකරයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ යෝජනාව සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදි සාකච්ඡා වුණා. මේ පිළිබඳව සංජීව රණසිංහ මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකරා. මෙම පාරට කාපට් එකක් ලබා දිමට තීරණය වුණා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ආදායම් වියදම් පිලිබඳව අදහස් සම්බන්ධව පැහැදිලි කිරිමක් කරනවා නම් හොදයි. නවක මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව අවබෝධයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

ගරු සභාපතිතුමාගේ හා ලලිත් සිරිවර්ධන මන්ත්‍රීතුමාගේ අවධානය යොමු කරන ලෙස විශේෂයෙන් කටුගහහේන රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි ස්ථාන මාරු වී බුලත්සිංහල රෝහල ස්ථාන මාරු වී ගොස් ඇත. එම වෛද්‍ය වරයා වෙනුවට වෙනත් වෛද්‍යවරයෙකු කටයුතු කරනවා. මට පෙරේදා දින ආරංචි වෙනවා මෙම කටුගහහේන රෝහලේ ඇති භාණ්ඩ වෙනත් රෝහල් වලට රැගෙන යනවා කියන එක එම රෝහලේ තිබූ පුටු වගයක් රැගෙන ගොස් තියෙනවා. මතුගම වැත්තැව රෝහලටත් නෙමෙයි, නාගොඩ රෝහලටත් නෙමෙයි. අපි බොහොම අමාරුවෙන් හිටපු වෛද්‍යවරයාද එක්ව සොහොනක් ඉවත් කර මිනිසුන් ජීවත් වන ස්ථානයක් බවට පත් කරා මේ පිළිබඳව ලලිත් සිරිවර්ධන මන්ත්‍රීතුමාට මේ අවස්ථාවේ කියා සිටිනවා සෞඛ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා මේ සම්බන්ධව දැනුවත් කරන ලෙස, ප්‍රාදේශීය රෝහල් අතරින් ලංකාවේ පළමු ස්ථානය ලබාගත් රෝහලක් බැවින් මේ පිළිබඳව සොයා බලා ඉදිරි කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

පසුගිය කාල සිමාව තුළ රාජකාරි සිදු වූ ආකාරය පිළිබඳව මතුගම ප්‍රාදේශීය සභාව වැඩ නොකරන ආයතනයක් විදියට තමයි රාජ්‍ය ආයතන අතර දැඩි අප්‍රසාදයක් තමයි තියෙන්නේ.

මතුගම ශ්‍රවණාගාරයේ වාහන අංගනය තුළ වාහන හතරක් දාන්න බැහැ මේ පිළිබඳව මම තොරතුරු ඉල්ලලා තියෙනවා මේ සම්බන්ධව තොරතුරු සභාපතිතුමා පැවසුවා ඊළඟ සභාවට ඉදිරිපත් කරන බව කියා සිටියා. මේ වාහන අංගනයට මට ලැබුණු තොරතුරු අනුව ලක්ෂ 75ක් 80ක වියදම් වෙලා තියෙනවා කියන එක. දැන් බැරිවෙලා හරි ශ්‍රවණාගාර භූමිය පුළුල් කරන්න වත්මන් රජය විසින් ප්‍රතිපාදන වෙන්කළහොත් මෙය ගලවා ඉවත් කරන්න සිද්ධවෙනවා. තාක්ෂණ නිලධාරින්ට තිබ්බේ අවශ්‍යතාවය මත යකඩින් මෙය හදන්න තිබ්බා.

මතුගම මහජන ක්‍රිඩාංගනය තුළ තට්ටු දෙකක වැසිකිළියක් හඳලා තියෙනවා කියලා ආරංචි වුනා. නගරයේ මිනිසුන්ට යන්න වැසිකිළියක් නැහැ. තට්ටු දෙකක වැසිකිළියක් හඳලා තියෙනවලු කෝටියක් වියදම් කරලා . මේ සම්බන්ධව සොයා බලන්න ඕන සභාපතිතුමනි,

මහජන ක්‍රීඩාංගනයට ඇතුළු වන තැන ගේට්ටුවක් දාලා තියෙනවා ලක්ෂ 14ක් වියදම් කරලා අපිට තොරතුරු ලැබිලා තියෙනවා. මේ සභාවේ කරන්න වෙන වැඩ තිබිලා නැද්ද, මලගෙදරකට ෆ්ලෑෂ් ලයිට් එකක් ගැහුවේ සල්ලි අයකරලා, පුටු දුන්නේ සල්ලි අය කරලා, වතුර ටැංකි ලබා දුන්නේ සල්ලි අයකරලා,

ජගත් පින්නගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් නාරවිල කොට්ඨාසයට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරා අක්කර දෙකක ඉඩමක් ලබාදෙන ලෙස, ඇමතිතුමා මැදිහත් වෙලා අක්කරයයි රූඩ් 02ක ප්‍රමාණයක් මේ වන විට එල්.ආර්.සී. එකෙන් වෙන්කරලා තියෙනවා. එතනින් එහා සභාව කටයුතු කරන්න ඕන කියන එක පැවරුම් නියෝගයකින් කටයුතු කරන්න ඕන. මේ සම්බන්ධව එතනින් එහාට කටයුතු සිද්ධවෙලා නැහැ.

සභාව සතු සම්පත, ඔප්පු තිරප්පු ටික, සභාවේ තියෙන ලියකියවිලි ටික කබඩ් එකක් උඩ නිකන් තියලා තියෙනවා මෙහෙමද සභාපතිතුමනි රාජ්‍ය නිලධාරින් කටයුතු කරන්නේ.

නාරවිල පන්සලට අනුබද්ද පවත්වාගෙන යනු ලබන පෙර පාසල එහි ගුරුවරුන් දෙදෙනෙක් සිටියා ව්‍යාපෘති පදනම මත සභාවේ පඩිනඩි ගෙවලා. එක් ගුරුවරියක් ස්ථිර වෙලා තියෙනවා. නමුත් මෙම පෙර පාසල ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසලක් නොවේ කියලා කියනවා.

පසුගිය දවස් වල ලොකුවට අපිට මඩ ගැහුවා මුදලට විකිණුනා කියලා. මම ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කරනවා කුමන හෝ පක්ෂයකට මේ මන්ත්‍රීධුරය සම්බන්ධව යම්කිසි කෙනෙක් එක රුපියලක් අරගෙන තියෙනවාද මොනවා හරි වරප්‍රසාදයක් අරගෙන තියෙනවාද, මේ මන්ත්‍රීධුර කාල සීමාව තුළ කවුරු හෝ ඔප්පු කළහොත් හෙට මේ මන්ත්‍රීධුරයෙන් මා ඉල්ලා අස්වෙනවා.

මම කැමතියි කොට්ඨාසයේ මන්ත්‍රීවරයා වන අමන් මන්ත්‍රීතුමා සමඟ එකතු වෙලා වැඩ කරන්න මම කැමතියි. සංවර්ධන කටයුතු සමගියෙන් කරමු කියලා මම ප්‍රකාශ කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**

ගරු ස්වාමින් වහන්සේ දැක්වූ අදහසට අදහසක් එකතු කරන්න තමයි මා නැගී සිටියේ . කටුගහහේන රෝහල ලංකාවෙම ප්‍රාදේශිය රෝහල් අතර පළමු ස්ථානයට ආපු රෝහල එම රෝහලට පළමු ස්ථානය අරගෙන දෙන්න එවකට හිටපු වෛද්‍යාවරයා වන රංජිත් දිසානායක වරයාට එහි ප්‍රණාමය හිමි විය යුතුයි. කටුගහේන රෝහල ඉතා දක්ෂ විදිහට දියුණු කළා. එතුමා දැන් බුලත්සිංහලට ගිහින් එහි ලස්සන වැඩ කටයුතු කරගෙන යද්දි අවාසනාවකට කළුතර දිස්ත්‍රික්කයටම පහසුකම් සහිත භික්ෂුන් වහන්සේලාට නේවාසිකව ප්‍රතිකාර කිරිමට භික්ෂු වාට්ටුවක් හැදුවා කටුගහහේන රෝහලේ නමුත් අද වන විට ස්ථාන භාර වෛද්‍ය වරයා එම භික්ෂු වාට්ටුව කාන්තා වාට්ටුවක් බවට පත්කරලා. ඒ වගේම මේ වන විට ගෞරවණිය ස්වාමින් වහන්සේ මතක් කල ආකාරයට කටුගහහේන රෝහලේ බඩු භාණ්ඩ වෙනත් රෝහල් කරා ගෙනයන බව. ලලිත් සිරිවර්ධන මන්ත්‍රීතුමා ප්‍රමුඛ 13දෙනෙකුගෙන් යුතු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව කාරුණික අවධානය යොමුකර රංජිත් දිසානායක වෛද්‍ය තුමා නැවතත් මෙම රෝහලට ගෙන ඒමට කටයුතු කරන ලෙස ගෞරවණිය ඉල්ලීම මේ අවස්තාවේ දි

ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ අවධානය විශේෂයෙන් යොමුකරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

මතුගම ශ්‍රවණාගරය තුල ස්ථාපිත කර ඇති වාහන ගාරාජ් එක ඉතා අවලස්සන සිද්ධියක්, ළමුන්ගේ විවිධප්‍රසංග, රාජ්‍ය උත්සව, ආගමික උත්සව පවත්වන්නේ මේ ශ්‍රවණාගාර භූමිය අරගෙන. මේ යෝජනාව ගෙනාවේ කවුද, මේ සඳහා වියදම් කළ මුදල කොපමණද යන්න සභාගත කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගිය සභාවේදීත් මා දිගින් දිගටම දැන්වීම් පුවරු සඳහා සටන් කලා. ගුරුවරුන් දැඩිලෙස ලක්වුණ මේ මාපියාව මෙවර අනිවාර්යෙන්ම නැවැත්විය යුතු යැයි යෝජනාවත් ඔබතුමාට කරමින් සභාවේ තියෙන අක්‍රමිකතා සොයා බලමින් ඒ වෙනුවෙන් පෙනී සිටින ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මෙම රංජිත් දිසානායක වෛද්‍ය වරයාට ඕනෑම තැනක වැඩ කිරිමට හැකියාව තියෙන බැවින් ඒ නිසා තමයි එතුමාව වෙනත් ස්ථානයක ස්ථාන මාරු කරලා තියෙන්නේ. එතුමාව මේ ප්‍රදේශයේම තියාගෙන සිටිමට සදාචාරාත්මක අයිතියක් නැහැ කියලා මම විශ්වාස කරනවා. රෝහල තුලින් පිටතට ගෙන ගියා කියන භාණ්ඩ අතිරික්ත නම් වෙනත් රෝහලකට පරිත්‍යාග කිරිමට අයිතියක් තියෙන්න ඕන. මෙම සභාවේ නිලධාරින්ට චෝදනා කරන්න හොඳ නැහැ. මම ඉල්ලිමක් කරනවා මම යෝජනා කරනවා ඊට අදාල තොරතුරු සමඟ කතා කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. ලාල් රංජිත් සිල්වා මහතා**

මගේ ප්‍රදේශයට ලබා දෙන ලක්ෂ විස්සට අඩු සියළු ව්‍යාපෘති කොන්ත්‍රාත් කරුවන් වෙත ලබා නොදෙන බවත් මගේ අධික්ෂණය යටතේ ගමේ සමිතියක් මගින් ශ්‍රමදායකත්වය යොදාගෙන එම ව්‍යාපෘති සිදු කරන බැවින්, මම සියළුම මන්ත්‍රීවරුන්ටත් ඒ යෝජනාව කරනවා. ලක්ෂ 20 අඩුවෙන් යන සියළුම ව්‍යාපෘති ගමේ ශ්‍රමදායකත්වය යොදාගෙන ගමේ සමිතිය මගින් සිදු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

කපිතාන් ජිවන් විතාන මාවත කඩා ඇති බැවින් මේ සම්බන්ධයෙන් හැකි ඉක්මණින් අවසන් කරන ලෙස ඉල්ලිමක් කරනවා. ජන අරගල සන්ධානයේ මන්ත්‍රීතුමා වෛද්‍ය වරයා පිළිබඳව දැක්වූ අදහසට අපිත් එකඟයි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කපිතාන් විතාන මාවතේ බෝක්කුව අපි සිකුරාදා දින දාන්න හිටියේ අධික වර්ෂාව හේතුවෙන් එය කර ගැනිමට හැකියාවක් ලැබුනේ නැහැ. ඒ සඳහා අඩි 4x4 බෝක්කු ගෙනවිත් තියෙන්නේ එම බෝක්කු මදි තත්ත්වයක් තමයි තියෙන්නේ. අද දවස තුළ අඩි 4x5 බෝක්කුවක් තමයි අවශ්‍ය අද දිනයේ එම බෝක්කු ලැබෙන බැවින් එය ගෙනා විගස එය තබා එම වැඩය අවසන් කිරිමට තමයි සුදානම්ව සිටින්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

ඒ.කේ.පී. වසන්ත යන අය 2016 සි 2025 දක්වා වරිපනම් අංශයේ රාජකාරි සිදු කර තිබෙනවා එතුමාව එතනින් ඉවත් කරලා තියෙනවා ඒ කුමන හේතුවක් නිසාද යන්න පැහැදිලි කරන්න පුළුවන්ද.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කොමසාරිස්තුමියගේ විමර්ශනයක් මත තමයි ලිපියක් එවලා තියෙනවා වරිපනම් අංශයෙන් ඉවත් කරන ලෙස දන්වා. නමුත් දැන් එය සාකච්ඡා මට්ටමේ තියෙන්නේ වෙනත් තැනක ඔහුට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා**

මතුගම අදාහනාගාරය අසල පෞද්ගලික ලයනල් මල් ශාලාව වගේ ප්‍රාදේශීය සභාව හරහා එවැනි ස්ථානයක් පවත්වාගෙන යන්න හැකියාවක් තියෙනවාද යන්න දැනගන්න පුළුවන්ද.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

එතන ඉඩකඩ මදි. මේ සම්බන්ධව අපි සාකච්ඡා මට්ටමේ ඉන්නේ. මේ සම්බන්ධව හඳුනාගත් ඉඩම් කිහිපයක් තියෙනවා ඔබතුමාගේ අදහසට මම ගරු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා**

කසළ කළමනාකරණය කිරිම පිළිබඳව විධිමත් පියවරක් ගන්නා ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් මම යෝජනා කරනවා වෙළඳ ප්‍රජාව ඒකරාශිකරගෙන මෙම වැඩ පිළිවෙල දියත් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

2025 අගෝස්තු 01 වන දින සිට මේ සම්බන්ධව ගැටළුවක් එන්නේ නැහැ පළමු වනදා සිට අපි රාත්‍රී සේවයක් යොදවනවා. හෙට දින ප්‍රචාරක දැන්වීමක් අපි ලබා දෙනවා. නැවත වාරයක් මේ ගැටළුව ඇති නොවන පරිදි අපි වැඩ කටයුතු කරගෙන යනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මෙම වෛද්‍යවරයා ස්ථාන මාරු වී ගියා නම් ඊට වඩා හොඳ වෛද්‍යවරයෙක් මෙම රෝහලට අනුයුක්ත කිරිම ඉතා වැදගත්. අපි මුදල් වියදම් කලා මිසක අපි මුදල් හම්බ කලේ නැහැ මුදලට විකුණුනේත් නැහැ. අපි මේ සභාපතිතුමාගේ හොඳ දේට සහයෝගය දක්වනවා මෙන්ම කොන්දේසි විරහිතව ඕනෑම නරක යෝජනාවක් මේ මතුගමට මතුගම ප්‍රාදේශයේ ජනතාව, අපේ සංස්කෘතියට, ආගමට වැරදි තීන්දුවක් ගන්නවා නම් එයට විරුද්ධව පෙනී සිටින බව ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

චක්‍රලේඛ සම්බන්ධ අණපනත් සම්බන්ධ අපිට ඒ ලිපි ලේඛන අපට ලැබෙන්න සලස්වන්න. ඒ වගේම මා යෝජනා කරනවා නේවාසික හෝ අනේවාසික පුහුණුවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

එදා ඡන්දය දවසේ රහුමානියා පාසලේ ඉදලා මම ගෙදර ගියා එතකොට දැනගන්න ලැබුණා ත්‍රිවිල් 5කුත් වෑන් එකකුත් එයා මෙහා ගියා. එතනදී පස්දෙනෙකු එකතුවෙලා එක් පුද්ගලයෙකුට ගහුවා ඊට පස්සේ ඔවුන්ව රෝහල්ගත කරන්න සිද්ධ වුණා. ඉන් පසු සියළු දෙනා සාකච්ඡා කරලා වන්දි දෙන්නම් කියලා සමගි වුණා. පසුව වාහන හදාදෙන එක සිදු කලේ නැහැ. දැන් මා විසින් එම වාහන හදාදිමට කටයුතු කරනවා. රජයෙන් ලබා දෙන පසුකම් අපිටත් දීලා සහයෝගයෙන් කටයුතු කරමු කියලා මා කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමන් ප්‍රසාද් මහතා**

කටුගහහේන ප්‍රාදේශීය රෝහල ගැන මම සොයා බැලුවා. රෝහලේ භාණ්ඩ වෙනත් ස්තානයකට ගෙන යන්නේද කියලා සොයා බලන්න මම කෙනෙක් පත් කරා. ඒ පිළිබඳව සොයා බලා අපේ දිස්ත්‍රික්කයේ තමයි සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නේ මේ සම්බන්ධයෙන් අද හෙටම මේ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

රුවන්දි මන්ත්‍රිතුමිය ගෙනා දැන්වීම් පුවරු සම්බන්ධයෙන් මේ වන විට අපි ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කරලා තියෙන්නේ .දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරිම සඳහා අපගේ නිර්දේශයක් ලබා ගන්නා ලෙස අපි ඉදිරිපත් කරලා තියෙන්නේ. ඉදිරියේදී ඒ කාරණා පිළිබඳව මා දැඩි ලෙස ඉන්නවා මොකද නගරය අවලස්සන කරන්න අවස්ථාවක් හදලා දෙන්නේ නැහැ. අද දින සභා වාරය මෙතනින් අවසන් කරනවා .

**න්‍යාය පත්‍රානුකූලව මෙදින නියමිත කටයුතු අවසන් විමෙන් පසුව මහ සභාවේ කටයුතු ප.ව. 2.30ට පමණ අවසන් විය.**

කසුන් මුණසිංහ.

සභාපති,

මතුගම ප්‍රාදේශීය සභාව.